TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tels : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපළ සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබෑන්ක් පාර,
කොළඹ 5

23 ඔක්තෝබර් 2019.

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ නිලධාරියෙක් තම ෆේස්බුක් ගිණුම ජනාධිපතිවරණ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය වන ආකාරයට යොදාගැනීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සම්බන්ධවයි.</u>

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත ලැබුණු පැමිණිල්ලකට අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අයත් ත්‍රිකුණාමලය, පදවිය පලුගහ වංගුව ද්විතික මහා විද්‍යාලයේ විදුහල්පති ජයන්ත පල්ලේවල මහතා තම ෆේස්බුක් ගිණුම ජනාධිපති අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය වන ආකාරයටත්, තවත් අපේක්ෂකයකු අගතියට පත් වන ආකාරයටත් භාවිතා කර ඇත. මීට අදාළ ඡායාරූප මේ සමඟ අමුණා ඇත.

මෙසේ දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ නිලධාරියෙක් තම පෞද්ගලික සමාජ ජාල ගිණුමක් භාවිතා කරමින් දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය වන ආකාරයට හෝ අගතියට පත් වන ආකාරයට ප්‍රචාරණය හෝ ප්‍රකාශ සිදු කිරීම මගින් 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 2 (VII) යන නියමය උල්ලංඝනය වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයාබලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා නැගෙනහිර පළාත් සම්බන්ධීකාරක කවීන් හෙට්ටිආරච්චි මහතා හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා 0763223442/0763223662 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.


ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දී පොදු දේපල අවභාවිතා වීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි.


මෙයට,
විශ්වාසී,

Lakwijaya Bandara
..................................

ලක්විජය බණ්ඩාර,
ජාතික සම්බන්ධීකාරක [PPPR]


Search
SRI LANKAN BLOOD
පාස්කු ප්‍රහාරය කෙරෙව්වේ
ගෝඨාභය
රාජපක්ෂ


Search
20 Oct at 21:23 ·
සහරාන් ඇතුළු 30කට
පසුගිය ආණ්ඩුව
පඩි ගෙව්වා


Search
Jayantha Pallewela
20 Oct at 12:20 ·
රට හදන බැම්ම